# මධ්‍ය වාර්ෂික ජනගහනය (2025 ජූලි මස 01 දිනට)

**වෙබ් නිකුතුව - ඔක්තෝම්බර්, 2025**

උපත්, මරණ හා සංක්‍රමණය රටක ජනගහනය වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක වේ. උපත්, මරණ හා සංක්‍රමණය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් බැවින් රටක හෝ කිසියම් භූමි ප්‍රදේශයක ජනගහනය කාලය සමග නිරන්තරයෙන් වෙනස් වීමට ලක්වේ. එසේ හෙයින් සෑම රටකම ජන සංගණනයක් පවත්වා කිසියම් නිශ්චිත මොහොතක් සළකා එම මොහොතේ සිටින ජනගහනය ගණනය කිරීම සිදු කරනු ලබයි. මේ අනුව ශ්‍රී ලංකාවේ 15 වන ජන හා නිවාස සංගණනය 2024 වර්ෂයේ දෙසැම්බර් මස 18 වන දින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

අන්තර් සංගණන කාල පරාසය තුල සෑම වසරකම රට තුල සිදුවන උපත්, මරණ හා සංක්‍රමණය පිළිබඳ පරිපාලනමය දත්ත පදනම් කරගෙන මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කරනු ලබයි. මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීම සෑම වසරකම ජූලි 01 වන දිනය පදනම් කොට සිදු කෙරේ. පෙර වර්ෂයේ ජූලි 01 දින සිට අදාළ වර්ෂයේ ජුනි 30 වන දින දක්වා ලියා පදිංචි කල උපත් හා මරණ වල වෙනස (ස්වභාවික වර්ධනය) හා ශුද්ධ සංක්‍රමණයේ එකතුව පෙර වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනයට එකතු කිරීමෙන් අදාල වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය ගණනය කරනු ලැබේ.

ස්වභාවික වර්ධනය = උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව

ශුද්ධ සංක්‍රමණය = රට තුලට පැමිණි සංඛ්‍යාව - රටින් පිටවූ සංඛ්‍යාව

**අදාළ වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය = පසුගිය වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය**

**+ (උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව)**

**+ (රට තුලට පැමිණි සංඛ්‍යාව - රටින් පිටවූ සංඛ්‍යාව)**

වගුව 1:  වාර්ෂිකව උපත්, මරණ, ශුද්ධ සංක්‍රමණය සහ ජනගහනය වෙනස්වීම  2025*

| කාල සීමාව | වර්ෂය | උපත් | මරණ | ස්වභාවික වර්ධනය | ශුද්ධ සංක්‍රමණය | ජනගහන වෙනස්වීම | මධ්‍ය වාර්ෂික ජනගහනය ('000) |
|---|---|---|---|---|---|---|---|
| 2024 දෙසැම්බර් 19 සිට 2025 ජූනි 30 දක්වා | 2025 | 110,652 | 95,181 | 15,471 | -41,002 | -25,531 | 21,756 |

*යාවකාලිකයි

මූලාශ්‍රය:  රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

2024/25 මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු සකස් කිරීම 2024 වර්ෂයේ පවත්වන ලද ජන හා නිවාස සංගණය මගින් ප්‍රකාශිත ජනගහනය පාදක කරගනිමින් සකස්කරන ලදී. ඒ අනුව 2024 දෙසැම්බර් මස 19 වන දින සිට 2025 ජූනි 30 දක්වා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද සජීවී උපත් සංඛ්‍යාවේ සහ  මරණ සංඛ්‍යාවේ වෙනස හා 2024 දෙසැම්බර් මස 19 වන දින සිට 2025 ජූනි 30 දක්වා රට තුලට පැමිණි සංඛ්‍යාව හා රටින් පිටවූ සංඛ්‍යාව අතර වෙනස 2024 දෙසැම්බර් මස 18 වන දින වාර්තා වූ ජනගහනයට එකතු කිරීමෙන් 2024/25 මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු සකස් කිරීම සිදුකර ඇත. මෙහි දී 2024 දෙසැම්බර් 19 වන දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා උපත්, මරණ සහ සංක්‍රමණ සංඛ්‍යාව එම මාසය තුල සිදුවූ මුළු උපත්,මරණ සහ සංක්‍රමණ සංඛ්‍යාවට අනුපාතිකව ගණනය කරන ලදී.